වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
வியாபார மற்றும் முதலீட்டுக் கொள்கைத் திணைக்களம்
Department of Trade and Investment Policy

මහලේකම් කාර්යාලය කොළඹ - 01
செயலகம், கொழும்பு - 01
The Secretariat, Colombo - 01

මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
Ministry of Finance

මගේ අංකය / எனது இல. / My No. : TIP/TP/01/10 (174)
ඔබේ අංකය / உமது இல / Your No. :
දිනය / திகதி / Date : 28.03.2022

රජයේ මුද්‍රණාලයාධිපති
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

මහත්මියණි

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වන වගන්තිය යටතේ වන ගැසට් නිවේදනය**

ගරු මුදල් අමාත්‍යතුමා විසින් පනවනු ලබන 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වන වගන්තිය යටතේ වන ගැසට් නිවේදනය **2022.03.28** දිනැති අංක **2273/01** දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සකස් කර මේ සමග එවමි.

මෙම නිවේදනයේ සෝදුපත් කියවීම සඳහා කොළඹ 01, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතනු මැනවි (කාර්යාලයීය දුරකථන අංකය 2484930 වේ).

මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසුව ඉන් පිටපත් 450 ක් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතද, පිටපත් 25 ක් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙතද එවනු මැනවි.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ විධි විධාන අනුව අප්‍රමාදව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුව ඇති බැවින් මුද්‍රිත පිටපත් ඉතා ඉක්මනින් මා වෙත ලැබෙන්නට සලස්වන්නේ නම් කෘතඥ වෙමි.

මෙයට - විශ්වාසී

**කේ. ඒ. විමලේන්තිරරාජා**
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් -**

- රේගු අධ්‍යක්ෂ ජනරාල්, මේ සමග එවනු ලබන 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වන වගන්තිය යටතේ වන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය කටයුතු සඳහා
- ලේකම්, වෙළඳ අමාත්‍යාංශය
- අධ්‍යක්ෂ ජනරාල්, වානිජ දෙපාර්තමේන්තුව - *වෙළඳ තොරතුරු ද්වාරය (Trade Information Portal) දැනුවත් කිරීම සඳහා*
- අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව- වෙබ් පිටුවේ පළකිරීම සඳහා

දුරකථන අංකය / தொலைபேசி / Telephone : 0112 484 888
ෆැක්ස් / தொலைநகல் / Fax : 0112 484 962, 0112 484 830
විද්‍යුත් තැපැල / மின்-அஞ்சல் / e-mail : admin@tipd.treasury.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website : www.treasury.gov.lk

**රජයේ නිවේදනයයි**

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

**5 වැනි වගන්ති යටතේ නියමය**

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මම, රේගු සංකේතාංක 0804.10.10 සහ 0804.10.20 යටතේ වාර්ගීකරණය වන රටඉඳි සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ වූ අංක 2270/19 සහ 2022 මාර්තු මස 09 දිනැති ගැසට් නිවේදනය මගින් අදාළ වන කිලෝ ග්‍රෑමයකට රු. 200 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු. 1.00 ක් අයකරගෙන ඉතිරි වටිනාකම අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

මෙම නියමය, 2022 මාර්තු මස ...28... දින සිට මාස 05 කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

**බැසිල් රාජපක්ෂ**
**මුදල් අමාත්‍ය**

2022 මාර්තු මස ...27... වන දින
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේදීය.

**Government Notification**

**Special Commodity Levy Act, No. 48 of 2007**

**Order under Section 5**

By virtue of the powers vested in me under Section 5 of the Special Commodity Levy Act No. 48 of 2007, I, Basil Rajapaksa, Minister of Finance of the Democratic Socialist Republic of Sri Lanka, do hereby make an order to waive-off balance amount after collecting Rs.1.00 per Kg from the applicable Special Commodity Levy of Rs. 200 per Kg on importation of Dates, classified under the HS Codes of 0804.10.10 and 0804.10.20, levied by the Gazette Notification No. 2270/19 dated March 09, 2022 under Section 2 of the Special Commodity Levy Act No. 48 of 2007.

This Order shall be valid for a period of 05 months effective from March ..28...... 2022 subject to provisions of Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007.

**Basil Rajapaksa**
**Minister of Finance**

Ministry of Finance
Colombo 01,

March ..27.... 2022.